# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,490 — 1965 අගෝස්තු 27 වැනි සිකුරාදා — 1965.8.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... | 1264 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 1261 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1262 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... | 1263 | ආණ්ඩුවේ වක්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1270 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

### 1965 අංක 316

අ. ආ. කා. අංක සී. 271/65

අග්‍රාණ්ඩුකාරතුමා, 1946 යේ හා 1947 තේ, ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥවල 51 වැනි වගන්තිය යටතේ, වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ වැඩ බලන ස්ථිර ලේකම්, ලංකා පරිපාලන සේවයේ, ඩී. ටී. ඊ. ඒ. ද ෆොන්සේකා මහතා 1965 ජුලි 24 වැනි දින සිට වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තනතුරට පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
කොළඹ, 1965 අගෝස්තු 24.

8/1094

### 1965 අංක 317

අංකය: ඩී 21/රෙක්ට්/190.

**යුද්ධ හමුදුව—නිත්‍ය භට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කර ඇති විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි තැන 1965 අගෝස්තු මස 8 වැනි දින සිට යුද්ධ හමුදා නිත්‍ය භට සේනාවෙන් විශ්‍රාම ගත්තා ලදී.

මේජර් බටුවත්ත ගමගේ සැම්සන් ද සිල්වා, ලං. ඉ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. ඩී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

8-942

## විශේෂ නිවේදනයයි

1965 සැප්තැම්බර් 10 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 සැප්තැම්බර් 9 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1965 සැප්තැම්බර් 4 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1965 අගෝස්තු 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 අංක 318

අංකය : ඞී. 1/රෙක්ට්/55.

### යුද්ධ හමුදාව—නිත්‍ය හට සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ජ්‍යෙෂ්ඨත්වය

1964 ජූලි මස 20 වෙනි දින සිට පහත නම් සඳහන් නිලධාරීන් මෙහි පෙන්වා ඇති පරිදි ජ්‍යෙෂ්ඨත්වය ගන්නවා ඇත :—

ලුතිනන් තන්ත්‍රිගේ වරුණ ලීලානන්ද රුබේරු, ල.ඉ.

ලුතිනන් ක්‍රිසන්ත පොරඹ ලියනගේ, ල.ඉ.

ලුතිනන් හපන්ගම ආරච්චිගේ සරත් වික්‍රමසූරිය, ල.ඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු 19 දින,
කොළඹ දීය.

8-1045

---

1965 අංක 319

අංකය : ඞී/ඩීඑප්/34

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරණ ලද උපසේවයට මාරු කිරීමක්

1965 ජූලි මස 15 වැනි දින සිට ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බලකායේ උපසේවයට මාරු කිරීම :—

මේජර් ප්‍රාන්සිස් ලූෂන් අමරසිංහ, ඊ. ඞී., ල. යු. පු. බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු 17 දින,
කොළඹ දී ය.

8-943

---

1965 අංක 320

අංකය : ඞී/ඩීඑප්/42 (III).

### යුද්ධ හමුදව—ලංකා ස්වේච්ඡා බල සේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරයෙන් ඉල්ලා අස්වීම

1965 නොවැම්බර් මස 1 වන දින සිට යුද හමුදාවේ ලංකා ස්වේච්ඡා බල සේනාවේ පහත සඳහන් නිලධාරියාගේ අධිකාරයෙන් ඉල්ලා අස්වීම, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලදී :—

උප ලුතිනන් මානගේ මෙත්තානන්ද ගුණරත්න—ලං.ජා.ආ.මු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු 16 දින,
කොළඹ දීය.

8-921

---

1965 අංක 321

අංකය : ඞී/ඩීඑප්/18/ඒ(II).

### රාජකීය ලංකා ස්වේච්ඡා නාවික බලකාය—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමතකර ඇති උසස් කිරීම්

**1955 අගෝස්තු 21 දින සිට ලුතිනන් පදවියට :**

උප ලුතිනන් ඊ. ජේ. ඇස්. ද ඇස්. විජේරත්න, රා.ලං.ස්වේ.නා.බ.

**1955 අගෝස්තු 22 දින සිට ලුතිනන් පදවියට :**

උප ලුතිනන් ජේ. එම්. ද කොස්තා, රා.ලං.ස්වේ.නා.බ.

**1963 අගෝස්තු 21 දින සිට ලුතිනන් කොමාන්ඩර් පදවියට :**

ලුතිනන් ඊ. ජේ. ඇස්. ද ඇස්. විජේරත්න, රා.ලං.ස්වේ.නා.බ.

**1963 අගෝස්තු 22 දින සිට ලුතිනන් කොමාන්ඩර් පදවියට :**

ලුතිනන් ජේ. එම්. ද කොස්තා, රා.ලං.ස්වේ.නා.බ.

(1955 අගෝස්තු 21 දින සිට උප ලුතිනන් ඊ. ජේ. ඇස්. ද ඇස්. විජේරත්න වැඩ බලන ලුතිනන් වශයෙන් සහ 1955 අගෝස්තු 22 වන දින සිට උප ලුතිනන් ජේ. එම්. ද කොස්තා වැඩ බලන ලුතිනන් පදවියට උසස් කිරීම් පිළිබඳව 1955 සැප්තැම්බර් 9 වැනි දින අංක 10,837 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ).

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එම්. ජී. වී. පී. ඩබ්ලිව්. සමරසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු 17 දින,
කොළඹ දීය.

8-835

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

1965 අංක 322

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේ.එම්. 2/56 (II).

ටී. ඞී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ජේ. ඞී. ද එස්. විජයරත්න මහතා 1965 අගෝස්තු 14 වැනි දින සිට 26 වැනි දින දක්වා, මාතර මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 27. ඒ/51.

අයි. එම්. ඉස්මයිල් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඞී. ඒ. ඊ. මීගම මහතා 1965 අගෝස්තු 5 වැනි හා 6 වැනි දිනයන්හි, පානදුරේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 10/48.

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1965 අගෝස්තු 31 වැනි දින, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/එස්. 30/63 (I).

අයි. ජී. එන්. ද ජැකොලයින් සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1965 අගෝස්තු 21 වැනි දින සිට 31 වැනි දින දක්වා, මඩකලපුවේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන, මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑච්. 34/48.

සී. එච්. උඩලාගම මහතා 1965 අගෝස්තු 28 වැනි දින, කෑගල්ල මහෙස්ත්‍රාත් උසාවියේ අංක එච්. සී. පී. 577/62 දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත්, ළමා මහෙස්ත්‍රාත් සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්. 31. බී/62.

එස්. ජෝකනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. එස්. ඒ. පෙරේරා මහතා 1965 අගෝස්තු 19 වැනි හා 20 වැනි දිනයන්හි, කුලියාපිටියේ පලාත් ආණ්ඩු සභා සීමා තුළ පිහිටි කනදුල්ලේ ක්‍රියා කරන පිණිස කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් 3. බී/60.

එස්. අමරසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1965 අගෝස්තු 12 වැනි දින, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 3. බී/60 (II).

එස්. අමරසිංහ මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එස්. මතවරාජා මහතා 1965 අගෝස්තු 13 වැනි දින සිට, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 35. බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස් පී. විජයතිලක මහතා 1965 අගෝස්තු 12 වැනි හා 13 වැනි දිනයන්හි, මාතලේ ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මාතලේ මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේ. එල්/ජී. 14/65.

එල්. ඒ. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. බී. පෙරේරා මහතා 1965 අගෝස්තු 13 වැනි දින, කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 68බී/53.

ඒ. වෛත්‍යලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩී. සේන්ට් ඊ. අමරසිංහ මහතා 1965 අගෝස්තු 20 වැනි හා 23 වැනි දිනයන්හි, අවිස්සාවේල්ලේ දිස්ත්‍රික් නඩුකාර තැන, රික්වැස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 37. ඒ/55.

පී. මාරපන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1965 අගෝස්තු 20 වැනි හා 21 වැනි දිනයන්හි, අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 40. බී/61.

බී. එස්. නෙත්තසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. බී. පෙරේරා මහතා 1965 අගෝස්තු 14 වැනි හා 15 වැනි දිනයන්හි කුරුණෑගල මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1965 සැප්තැම්බර 4 වැනි හා 5 වැනි දිනයන්හි මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වැස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1965 සැප්තැම්බර 2 වැනි හා 3 වැනි දිනයන්හි, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරමේ ගම්බද උසාවි සභාපති තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/වයි. 3/51.

එන්. එම්. යුසුප් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, බී. එෆ්. සියඹලාපිටිය මහතා 1965 අගෝස්තු 9 වැනි දින, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ, බෙලිගල්, කිණිගොඩ සහ පරණ කුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 1/48.

එම්. බී. කප්පාගොඩ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, යූ. රත්නායක මහතා 1965 අගෝස්තු 10 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර සහ උඩ දුම්බර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 5/61.

සී. ආර්. රාජසිංහම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1965 අගෝස්තු 20 වැනි දින හා 23 වැනි දින සිට 26 වැනි දින දක්වාද, මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර් කෝරලේ, බින්තැන්න පත්තුවේ සහ උතුරු මාන්මුනෙයි ගම්බද උසාවි සභාපති තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 6/61.

පී. බී. හේරත් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ශ්‍රී පද්මනාදන් මහතා, 1965 අගෝස්තු 12 වැනි දින සිට 14 වැනි දින දක්වාද, 16 වැනි හා 17 වැනි දිනයන්හිද, බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුක්ද සහ වැල්ලවායේ ගම්බද උසාවි සභාපති තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එම්. 7/56.

එන්. වී. පී. මැන්දිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා 1965 අගෝස්තු 18 වැනි දින සිට 20 වැනි දින දක්වා හා 23 වැනි දිනද, ගාල්ල දිස්ත්‍රික්කයේ ගහබොඩ හා හිනිදුම් පත්තුවල ගම්බද උසාවි සභාපති තැන වශයෙන් සහ වැල්ලබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/කේ. 4/48.

කේ. අයි. කරුණාරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඕ. ද මැල් මහතා 1965 අගෝස්තු 19 වැනි දින සිට 21 වැනි දින දක්වාද, 23 වැනි දින හා 26 වැනි දින සිට 28 වැනි දින දක්වාද, 30 වැනි හා 31 වැනි දිනයන්හිද, පානදුර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරලේ සහ පානදුර තොට මුනේ ගම්බද උසාවි සභාපති තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑෆ්. 19/57.

එම්. ඒකනායක මහතා 1965 අගෝස්තු 17 වැනි දින සිට වැලිගම ගම්බද උසාවියේ අංක 10101 දරණ අපරාධ නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, මාතර දිස්ත්‍රික්කයේ වැල්ල බොඩ පත්තුවේ කඩවත් සතරේ සහ වැලිගම් කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් සහ ගහබොඩ පත්තුවේ අතිරේක ගම්බද උසාවි සභාපති තැන වශයෙන්.

සී. ඊ. ජයවර්ධන,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 19 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573.
කොළඹ 12.

8-910

---

## වේතන පත්කිරීම් ආදිය

**1965 අංක 323**

අතිගරු අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව, එතුමා විසින්—

මගේ අංක පා. 4/සාවි. 5/2.

නීතිඥ පී. පී. ජයවර්ධන මහතා, ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාරවරයෙකු සහ නිලනොලත් මහෙස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

අංක පා. 4/සාවි. 10/4.

නීතිඥ පී. විජයරත්නම් මහතා, නුවර එළිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකාරවරයෙකු සහ නිලනොලත් මහෙස් ත්‍රාත් වරයෙකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. 20/15.

කනගසබාපති වේළුපිල්ලෙ කනගරත්නම් මහතා යාපනේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

සුබ්‍රමානියම් සතාසිවම් මහතා යාපනේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

අංක : ඒ. ජේ. 20/64/6.

රාමලිංගම් මුතුකුමාරු අරුණාසලම් මහතා යාපනේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

අංක : පා. 4/සාවි. (නිල) 3.

ඩී. ඩැන්ෆේජන් මහතා පළාත් පාලන අමාත්‍යාංශයේ කායකීල සහායක ධුරය දරණ කලය තුල කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමාදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද

පත්කර ඇත්තේය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1965.8.21 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

8-987

---

# ආණ්ඩුවේ නිවේදන

## 1963 අංක 4 දරණ දේශීය ආදයම් පනත

### 67 (1) වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1963 අංක 4 දරණ දේශිය ආදායම් පනතේ 67 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති, උක්කු බණ්ඩා වන්නිනායක වන මම, මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ආයතනය එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් මේ දැන්වීමෙන් ප්‍රකාශයට පත් කරමි.

යූ. බී. වන්නිනායක,
මුදල් ඇමති.

1965, අගෝස්තු 25 වැනි දින,
කොළඹදීය.

### උපලේඛනය

ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය.
ලංකාවේ සාගින්නෙන් මිදීමේ පදනම.

8–1093

---

## ගම්බද අධිකරණ ආඥාපනත

### දැන්වීමයි

මගේ අංකය : ජේ. ආර්. සී. 13/64.

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ නැගෙනහිර ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ, ලෝඑවෙල ගමෙහි පිහිටියා වූද, උතුරට සහ නැගෙනහිරට අ.ග.පි. 69 දරන පිඹුරේ අංක 15. ජී දරන බිම් කැබැල්ලේ ඉතිරි කොටසින් ද, දකුණට කයිකාවෙල-මාගල්ලැව රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරින් සහ බස්නාහිරට ලොට් නොම්මර 15. එෆ් කොටසේ මායිමෙන් මායිම් වූද, නයාපල්ල නොහොත් මීගහමූල තැන්න සහ තොටිල්ල ගහමූල දෙමැද නමින් හැඳින්වෙන ඉඩමෙහි වූ නව ගොඩනැගිල්ල, ලෝඑවෙල ගම්බද අධිකරයේ අධිකරණ ශාලාව වශයෙන් පාවිච්චි කිරීම සඳහා (8 වෙනි අධිකාරය වන) ගම්බද අධිකරණ ආඥාපනතෙහි 19(2) වෙනි වගන්තිය යටතේ අධිකරණ ඇමතිවරයා විසින් වෙන්කර තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 17 වෙනි දින,
කොළඹ දී ය.

8-879

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1963 අංක 12 දරණ පනතින් සංශෝධිත, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වන වගන්තියෙහි (1) හා (8) වන උප වගන්තිවලින් හා 4 වන වගන්තියෙහි (1) උප වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙන් සැන්ඩර් ෆේපයාර්ලි විජේමාන්න වන මම—

(අ) 1964.11.6 දින සහ අංක 14,216 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 2 න් විස්තර කරනු ලැබූ පල්ලෙවෙල ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සැමාජික යින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) කල්එලියේ, වැල්ලවිලමුල්ලේ, "සිසිර නිවස" හි ජේ. ඇම්. පියසේන මහතා.

(2) පල්ලෙවෙල පදිංචි තෙවරප්පෙරුමගේ දොන් කරෝලිස් සිංඤෝ මහතා.

(3) පල්ලෙවෙල, අම්බලන්වත්තේ පදිංචි හේවාපේ ඩීගේ නදෝරිස් මහතා.

(4) පල්ලෙවෙල, අම්බලන්වත්තේ පදිංචි රන්තිලකගේ අමරසිංහ මහතා.

(5) පල්ලෙවෙල, අම්බලන්වත්තේ පදිංචි මෙරහල් බේදිගේ විජේසිංහ මහතා.

(6) පල්ලෙවෙල, පැලපිටිගම, අංක 228 හි පදිංචි ඇල්. අමර සිංහ මහතා.

(7) බාඳුරාගොඩ, ගස්පේ පදිංචි හෙට්ටියා කන්දගේ ලෝසන්ස් ප්‍රනාන්දු මහතා.

(8) කල්එළියේ, "වෙද නිවස" හි පදිංචි විතාන ආරච්චිගේ ඩැනී කොර්නේලිස් විතාන මහතා.

(9) කල්එළියේ, වැල්ලවිලමුල්ලේ පදිංචි වදුරව කංකානම ලාගේ මෙතියස් සිංඤෝ මහතා .

(10) කල්එළියේ, වැල්ලවිලමුල්ලේ පදිංචි අලිය මරික්කාර් අබූතහීර් මහතා.

(11) බාඳුරුගොඩ, ගනිමුල්ලේ පදිංචි ඩී. සී. දිසානායක මහතා.

(12) බාඳුරුගොඩ, කැප්පිටිවලාන පදිංචි ජයසේකර පතිරන් නහලාගේ සමරතුංග ජයසේකර මහතා.

(13) බාඳුරාගොඩ පදිංචි නානායක්කාර සෙනරත් අප්පුහාමි ලාගේ සෝමචන්ද්‍ර ආරියරත්න මහතා.

(14) බාඳුරාගොඩ, උඩුමුල්ලේ පදිංචි ඩී. සී. විජයසුන්දර මහතා.

(15) පල්ලෙවෙල පදිංචි දිසානායක මුදියන්සේලාගේ ජයසිංහ මහතා.

(16) පල්ලෙවෙල, කුකුල්නාපේ පදිංචි පීටර් රණතුංග මහතා.

(17) පල්ලෙවෙල, පැලපිටිගම පදිංචි අමරසිංහ ජේඩීගේ සෝමපාල මහතා.

(18) පල්ලෙවෙල, පැලපිටිගම පදිංචි අමරසිංහ ජේඩීගේ ඇල්බියන් මහතා

(19) කල්එළියේ, වැබඩමුල්ලේ පදිංචි ගමගේ එමලීයානු මහතා.

(ආ) කල්එළියේ, වැල්ලවිලමුල්ලේ, "සිසිර නිවස" හි පදිංචි ජේ. ඇම්. පියසේන මහතා එකී සභාවෙහි සභාපති වශයෙන් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත්කරනු ලැබූ කාලය ගැසට් පත්‍රයෙහි මේ ආඥාව ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1965 අගෝස්තු මස 19 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-898

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1963 අංක 12 දරණ පනතින් සංශෝධිත, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වන වගන්තියෙහි (1) හා (8) වන උප වගන්තිවලින් හා 4 වන වගන්තියෙහි (1) උප වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙක්සැන්ඩර් ෆේපයාර්ලි විජේමාන්න වන මම—

(අ) 1964.11.6 දින සහ අංක 14,216 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 3 න් විස්තර කරනු ලැබූ අපරැක්ක-බඹරැන්ද ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත්කරමි :—

(1) යටියන, කඩවැද්දුව, කනංකේ හාල්මෝලේ පදිංචි දෙන් කරෝලිස් අබේසුන්දර මහතා.

(2) කෝට්ටගොඩ, හුන්නදෙනියේ පදිංචි ඩේවිඩ් දිසානායක මහතා.

(3) කෝට්ටගොඩ, ආරපොත පදිංචි මනිමේන්ද්‍ර ආචාරිගේ පීටර් මහතා.

(4) කෝට්ටගොඩ, ආරපොත පදිංචි පියදාස දන්තනාරායන මහතා.

(5) කෝට්ටගොඩ, ආරපොත පදිංචි මනිමේන්ද්‍ර ආචාරිගේ එඩ්මන්ඩ් මහතා.

(6) දියගහ, පල්ලේ අපරැක්කේ පදිංචි නානායක්කාර වික්‍රම සේකර පල්ලියගුරුගේ ප්‍රැන්සිස්කු ගුණරත්න මහතා.

(7) යටියන, උඩඅපරැක්කේ පදිංචි ඕකන්ද ගමගේ දෙන් ජුවානිස් මහතා.

(8) යටියන, හිඟුරුපත්තල පදිංචි ජේම්ස් ගුණරත්න මහතා.

(9) දියගහ, පල්ලේ අපරැක්කේ "ජයවර්ධන වෙළඳ සැල" පදිංචි වැලිගම පල්ලියගුරුගේ දෙන් ජුවානිස් වික්‍රම සේකර ජයවර්ධන මහතා.

(10) ඌරුගමුවේ, දන්දෙනියේ පදිංචි අමරසිංහ කන්කානම්ගේ ආරියදාස මහතා.

(11) යටියන උඩ අපරැක්ක, නාකුට්ටිය කොළනියේ පදිංචි රොබිසන් අබේගුණවර්ධන මහතා.

(12) යටියන උඩඅපරැක්ක, නාකුට්ටිය කොළනියේ පදිංචි කංකානිගේ දෙන් ඩයස් මහතා.

(13) රත්මලේ, දන්දෙනියේ පදිංචි මාරුතුඩුව ගමගේ දෙන් සාමෙල් මහතා.

(14) යටියන, කඩවැද්දුව පදිංචි අබේසුන්දර හෙට්ටිගේ සිරිසේන නානායක්කාර මහතා.

(15) රත්මලේ, බඹරැන්දේ "නිහතමානී" හි පදිංචි කනංකෙ ලියනගේ දෙන් දියෝනිස් ගුණවර්ධන මහතා.

(16) රත්මලේ, බඹරැන්දේ "සුදම්" හි පදිංචි දෙන් ටර්නේලිස් ගුණසේකර රාජපක්ෂ මහතා.

(17) රත්මලේ, බඹරැන්දේ, වාඩිගාවෙගෙදර පදිංචි දමියන්ගොඩ ගමගේ සල්මන් යාපා මහතා.

(18) රත්මලේ, බඹරැන්දේ, "කුසුම්" හි පදිංචි දෙන් කොරනේලිස් බුලේගොඩ ආරච්චි මහතා.

(19) රත්මලේ, නෙළුම්වැව "සුධර්මා" හි පදිංචි දෙන් පවුලිස් කුරුවිට මහතා.

(20) දික්වැල්ලේ උප තැපැල් ස්ථානාධිපති තිප්පල ගමගේ පියදාස ගුණවර්ධන මහතා.

(21) දියගහ, බැද්දේගම්මැද්ද පදිංචි සුවාරිස් රත්නායක මහතා.

(22) දියගහ, බැද්දේගම්මැද්ද පදිංචි හමරාගොඩ කොඩිතුවක්කු ආරච්චිගේ පියදාස ජිනදාස මහතා.

(23) කැකණදුර, නාඔටුන්නේ "මංගල" හි පදිංචි හේවා මාස්මුල්ලගේ සෝමා අබේවර්ධන මහත්මිය.

(24) යටියන, කඩවැද්දුවේ පදිංචි පල්ලියගුරුගේ පියදාස නානායක්කාර මහතා.

(25) කෝට්ටගොඩ, හුන්නදෙනියේ පදිංචි දෙන් කොර්නේලිස් පලිහක්කාර අමරසේකර මහතා.

(26) කෝට්ටගොඩ, පොහොසතුගොඩ පදිංචි අබේසේකරගේ අප්පු මහතා.

(ආ) යටියන කඩවැද්දුවේ කනංකෙ හාල් මෝලේ පදිංචි දෙන් කරෝලිස් අබේසුන්දර මහතා එකී සභාවෙහි සභාපති වශයෙන් පත්කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් තැනැත්තකු පත්කරනු ලැබූ කාලය ගැසට් පත්‍රයෙහි මේ ආඥාව ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1965 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-899

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1963 අංක 12 දරණ පනතින් සංශෝධිත, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වන වගන්තියෙහි (1) හා (8) වන උප වගන්තිවලින් හා 4 වන වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙක්සැන්ඩර් ෆේපයාර්ලි විජේමාන්න වන මම—

(අ) 1964.3.26 දින සහ අංක 13,996 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 2 න් විස්තර කරනු ලැබූ ගඟබඩපත්තු නැගෙනහිර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) හොරණ, දෙල්මැල්ල, ශ්‍රී පුණ්‍යවර්ධනාරාමවාසී පූජ්‍ය මිල්ලැවේ සරණතිස්ස ස්ථවිරයන් වහන්සේ.

(2) බුලත්සිංහල, බෝතලේ පදිංචි සිමන් ද සිල්වා රණසිංහ මහතා.

(3) බුලත්සිංහල, බෝතලේ පදිංචි රණවක ආච්චිගේ දෙන් දියෙස් සිංඤෝ මහතා.

(4) බුලත්සිංහල, පදිංචි කරුණාරත්න ආරච්චිගේ මූනිස් සිංඤෝ මහතා.

(5) අගලවත්තේ සමූපකාර සංගමයේ දෙන් ඉලියන් සෝමපාල මහතා.

(6) මහගම, ඉම්මිල්ල පදිංචි බෝතලාගේ ඩේවිඩ් මහතා.

(7) බුලත්සිංහල, වෙල්ගම, නයිගොඩ පදිංචි එච්. ඩී. සයිමන් සිංඤෝ මහතා.

(8) ඉංගිරියේ පදිංචි සූරිය ආරච්චිගේ දියෝනිස් සරත්චන්ද්‍ර මහතා.

(9) හොරණ, පරගොඩ පදිංචි පී. පී. ඇම්. පොන්සේකා මහතා.

(10) බුලත්සිංහල, අතර පදිංචි ඒ. ඩබ්ලිව්. ඉන්ද්‍රරත්න මහතා.

(11) බුලත්සිංහල, පහළවෙල්ගම, "ජයසිරිමැදුර" හි පදිංචි ඩී. ඒ. කන්නන්ගර මහතා.

(12) බුලත්සිංහල, ඇගල්ඔය පදිංචි දියකඩුවගේ දෙන් හේමපාල මහතා.

(13) මහගම, නායදෙළ පදිංචි නායගේ තෝමිස් ප්‍රනාන්දු මහතා.

(14) බුලත්සිංහල, අමරගෙදර පදිංචි ඇල්. යූ. ඩී. පෙරේරා මහතා.

(15) බුලත්සිංහල ඇගල්ඔය පදිංචි රණවක ආච්චිගේ දෙන් ඒබ්‍රහම් අප්පුහාමි මහතා.

(16) හොරණ, දෙල්මැල්ල පදිංචි ලියන ආරච්චිගේ දෙන් දිලිසියෙස් අප්පුහාමි මහතා.

(17) බුලත්සිංහල, යටගම්පිටියේ, ගල්කැපියේ, "උතුරුසල" පදිංචි වටවල හේවාගේ සාරිස් අභයරත්න මහතා.

(18) බුලත්සිංහල, වෙල්ගම, අතර පදිංචි ජී. යසපාල මහතා.

(ආ) බුලත්සිංහල, බෝතලේ පදිංචි සිමන් ද සිල්වා රණසිංහ මහතා එකී සභාවෙහි සභාපති වශයෙන් පත්කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත්කරනු ලැබූ කාලය ගැසට් පත්‍රයෙහි මේ ආඥාව ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1965 අගෝස්තු මස 19 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-900

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1963 අංක 12 දරණ පනතින් සංශෝධිත, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වන වගන්තියෙහි (1) හා (8) වන උප වගන්තිවලින් හා 4 වන වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙක්සැන්ඩර් ෆේයාර්ලි විජේමාන්න වන මම—

(අ) 1964.12.4 දින සහ අංක 14,247 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 2 න් විස්තර කරනු ලැබූ දික්වැල්ල ගම්කාර්‍ය සභාවේ අංක 10, 11, 12, 13, 19, 20, 21, 22, 23, 24, 25, 26, 27 හා 28 දරණ කොට්ඨාශ වලින් සමන්විත වූ දික්වැල්ල අංක 2 දරණ ගම්ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) දික්වැල්ලේ, මාලියද්දේ විහාරවාසී පූජ්‍ය බඹරන්දේ උපතිස්ස ස්වාමීන් වහන්සේ.

(2) දික්වැල්ලේ, බතීගම පදිංචි බාරොන් එදිරිසිංහ මහතා.

(3) දික්වැල්ලේ, වත්තේගම, "චන්ද්‍රා" හි පදිංචි ආරියසිංහ නිගමුණි මහතා.

(4) දික්වැල්ලේ, බතීගම පදිංචි දොන් සුමතිස්ස රාජපක්ෂ මහතා.

(5) දික්වැල්ලේ, බතීගම පදිංචි දඩල්ලගේ සිංඤොඅප්පුනන්දසේන මහතා.

(6) දික්වැල්ලේ, බතීගම, සිරිවුල්ලපදුම මාවතේ පදිංචි අර්දියස් නිගමුණි මහතා.

(7) ඌරුගමුවේ, කිරිනැලියේ "ශාන්ත" හි පදිංචි කිරිනැලියගමගේ ඩැනී මහතා.

(8) දික්වැල්ලේ, බතීගම බටහිර පදිංචි පියසේන අබේවර්ධන මහතා.

(9) දික්වැල්ලේ, මාලියද්දේ පදිංචි යසෝදිස් පීටර් මුතුකුමාරණ මහතා.

(10) දික්වැල්ලේ, පොල්ගහමුල්ලේ පදිංචි මෙරෙන්චිකංකානම් ගමගේ ආතර් ජයසේකර මහතා.

(11) දික්වැල්ලේ, මාලියද්දේ පදිංචි කපුගම ගීගනගේ ධර්මසිරි මහතා.

(12) දික්වැල්ලේ, පහමුනේගොඩ පදිංචි දෙන් ඒබ්‍රහම් කුමානායක මහතා.

(13) කෝට්ටගොඩ, හුන්නදෙනියේ පදිංචි ඩේවිඩ් ආතර් අමරසිංහ මහතා.

(14) කෝට්ටගොඩ, හුන්නදෙනියේ පදිංචි විල්සන් පේද්‍රික් අමරසිංහ මහතා.

(15) කෝට්ටගොඩ, හුන්නදෙණියේ පදිංචි චන්ද්‍රසිරි පලිහක්කාර අමරසේකර මහතා.

(16) දික්වැල්ලේ, පොල්ගහමුල්ලේ පදිංචි දොන් නිකුලස් ගුණසේකර මහතා.

(17) දික්වැල්ලේ, පොල්ගහමුල්ලේ පදිංචි හේවා තොක්ඕලේගේ තිලකවර්ධන මහතා.

(18) දික්වැල්ලේ, මාලියද්දේ පදිංචි හේවා ගජමන් කංකානම්ගේ ධර්මදාස මහතා.

(19) දික්වැල්ලේ, පොල්ගහමුල්ලේ පදිංචි මෙරෙන්චිකංකානම්ගේ සෑම් ජයසේකර මහතා.

(20) ඌරුගමුවේ, මුරුතගස්පිටියේ පදිංචි හේවා අංගප්පුලිගේ මදුරපාව මහතා.

(21) ඌරුගමුවේ, දෙනිමුල්ලවත්තේ පදිංචි දොන් ඩේවිඩ් වික්‍රමරත්න මහතා.

(22) ඌරුගමුවේ, මූකලංයායේ පදිංචි ඉහළවෙල කන්කානම්ගේ සෝමපාල මහතා.

(23) ඌරුගමුවේ, වේහැල්ලේ පදිංචි ෆ්‍රෙඩ්රික් ලයනල් ද සිල්වා සෙනෙවිරත්න මහතා.

(ආ) දික්වැල්ලේ, බතීගම පදිංචි බැරොන් එදිරිසිංහ මහතා එකී සභාවෙහි සභාපති වශයෙන් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලැබූ කාලය ගැසට් පත්‍රයෙහි මේ ආඥාව ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

ඒ. ඇෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1965 අගෝස්තු මස 19 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-901

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1963 අංක 12 දරණ පනතින් සංශෝධිත, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වන වගන්තියෙහි (1) හා (8) වන උප වගන්තිවලින් හා 4 වන වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙක්සැන්ඩර් ෆේයාර්ලි විජේමාන්න වන මම—

(අ) 1964.11.6 දින සහ අංක 14,216 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 1 න් විස්තර කරනු ලැබූ කොටදෙණියාව ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) මීරිගම, හල්පේ පදිංචි ඩේවිඩ් සෙනරත් දසනායක මහතා.

(2) මීරිගම, හල්පේ පදිංචි හේරත්රාල්ලාගේ ගුණසේන මහතා.

(3) බාඳුරාගොඩ, කිතුල්වල පදිංචි මුතුගල්පේඩිගේ සිරිවර්ධන මහතා.

(4) මීරිගම, පරණ හල්පේ පදිංචි සිංහල පේඩිගේ පබිලිස් මහතා.

(5) බැඳුරාගොඩ, වත්තෙමුල්ලේ පදිංචි කංකානි ආරච්චි අප්පුහාමිල්ලාගේ චාර්ලිස් ඇඩිමන් අප්පුහාමි මහතා.

(6) කොටදෙණියාවේ, කුලීගෙදර පදිංචි මුතුකුඩ අප්පුහාමිල්ලාගේ කොර්නේලිස් මහතා.

(7) බාඳුරාගොඩ, රස්සපාන පදිංචි රස්සපාන අප්පුහාමිල්ලාගේ සයිමන් අප්පුහාමි මහතා.

(8) නාවාන පදිංචි මුතුකුට්ටි ආරච්චිගේ පීරිස් මහතා.

(9) කොටදෙණියාවේ, පරගොඩ පදිංචි හපුගල ආරච්චිගේ වෛද්‍යසේකර මහතා.

(10) කොටදෙණියාවේ, එරබද්ද පදිංචි කරුණාපතිරන්නැහැලාගේ ඇරොන් සිංඤෝ මහතා.

(11) බාඳුරාගොඩ, රස්සපාන පදිංචි අදිකාරි අප්පුහාමිල්ලාගේ තෝමිස් අප්පුහාමි මහතා.

(12) දිවුලපිටියේ, බලගල්ලේ පදිංචි ජිනරාජදාස ගාමිණී විජේවර්ධන ජයතිලක මහතා.

(13) කොටදෙණියාවේ, කුලීගෙදර පදිංචි සූරිය ආරච්චිරාල්ලාගේ වේලාරත්න මහතා.

(14) කොටදෙණියාවේ, කුලීගෙදර පදිංචි ඇලබඩ කන්කානමලාගේ පියසේන මහතා.

(15) කොටදෙණියාවේ, කුලීගෙදර පදිංචි ජයනෙත්ති පතිරන්නැහැලාගේ සිරිසේන මහතා.

(16) බාඳුරාගොඩ, පහළ කළුඅග්ගල පදිංචි අතාඋද අච්චිතලම් මැහැර ලේකමලාගේ කරුණාරත්න මහතා.

(17) කොටදෙණියාවේ, පදිංචි දෙන් හෙන්රි කරුණාරත්න මහතා.

(18) කොටදෙණියාවේ, පරගොඩ පදිංචි නයිනානායක පතිරන්නැහැලාගේ නන්දසේන මහතා.

(19) කොටදෙණියාවේ, පරගොඩ පදිංචි හපුගල ආරච්චිගේ විජේරත්න මහතා.

(20) බාඳුරාගොඩ, නාරනාපිටියේ පදිංචි අදිකාරිගේ හේමපාල අදිකාරි මහතා.

(21) බාඳුරාගොඩ, හඟවත්තේ පදිංචි මූදන්නායක අප්පුහාමිල්ලාගේ එමලියෙස් අප්පුහාමි මහතා.

(22) කොටදෙණියාවේ, හෙට්ටිමුල්ලේ "ප්‍රයාග" හි පදිංචි ගාර්දි අච්චිගේ කරුණාසේකර මහතා.

(ආ) මීරිගම, හල්පේ පදිංචි ඩේවිඩ් සෙනරත් දසනායක මහතා එකී සභාවෙහි සභාපති වශයෙන් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලැබූ කාලය ගැසට් පත්‍රයෙහි මේ ආඥාව ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

ඒ. ඇෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1965 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-903

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1963 අංක 12 දරණ පනතින් සංශෝධිත, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වන වගන්තියෙහි (1) හා (8) වන උප වගන්තිවලින් හා 4 වන වගන්තියෙහි (1) වන උප වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙක්සැන්ඩර් ෆේයාර්ලි විජේමාන්න වන මම—

(අ) 1964.12.4 දින සහ අංක 14,247 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 1 න් විස්තර කරනු ලැබූ දික්වැල්ල ගම්කායෝ සභාවේ අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 14, 15, 16, 17 හා 18 දරණ කොට්ඨාශවලින් සමන්විත වූ දික්වැල්ල අංක 1 දරණ ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

1. දික්වැල්ලේ අළුත්ගොඩ "සේනානි" හි පදිංචි කුට්ටිවිදාන ආරච්චිගේ අමරසේන මහතා.
2. දික්වැල්ලේ මුස්ලිම් වීදියේ "සම්සුල් විලා" හි පදිංචි අබ්දුල් ලතීෆ් මහම්මදු යෙහියා මහතා.
3. දික්වැල්ලේ දෙඩම්පහළ "ජයසිරි" හි පදිංචි දාවිත් සිංඤෝ සුගතදාස ජයසූරිය මහතා.
4. දික්වැල්ලේ "නුවණ" හි පදිංචි හේවා තොන්ඩිලේගේ සරදියස් මහතා.
5. දික්වැල්ලේ වැවුරුකන්නල පදිංචි පල්ලිමුල්ලේ හේවා ගීගනගේ ජිනදාස මහතා.
6. දික්වැල්ලේ වැවුරුකන්නල පදිංචි යසෝදිස් නම්බුකාර පල්ලිය ගුරු මහතා.
7. දික්වැල්ලේ වැවුරුකන්නල පදිංචි නම්බුකාර තන්තිරිගේ චාලි සෙනෙවිරුජ මහතා.
8. දික්වැල්ලේ දඹගස්ආරේ පදිංචි සවුන්ද හැන්නදිගේ විජයදාස මෙන්ඩිස් මහතා.
9. දික්වැල්ලේ ඉදිගස්ආරේ පදිංචි පලවින්නගේ සෝම රත්න මුතුකුමාරණ මහතා.
10. දික්වැල්ලේ වැවුරුකන්නල පැලවත්තේ පදිංචි පලවින්නගේ සුමනදාස මුතුකුමාරණ මහතා.
11. දික්වැල්ලේ වලස්ගල "රත්නමහල්" හි පදිංචි තල්පෙ ගුරුගේ පියදාස ප්‍රදිනන්දිස් මහතා.
12. දික්වැල්ලේ මහවීදියේ පදිංචි නානායක්කාර වෙල්ලාළගේ දයානන්ද මහතා.
13. දික්වැල්ලේ වැලිහිටියේ පදිංචි බඹරන්ද ගුරුගේ නන්ද සේන මහතා.
14. දික්වැල්ලේ මුස්ලිම් වීදියේ පදිංචි අහමඩ් අබ්දුල්ලා මොහමඩ් මදනි මහතා.

(ආ) දික්වැල්ලේ අළුත්ගොඩ "සේනානි" හි පදිංචි කුට්ටි විදාන ආරච්චිගේ අමරසේන මහතා එකී සභාවෙහි සභාපති වශයෙන් පත් කරමි.

(ඇ) ඉහතකී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත්කරනු ලැබූ කාලය ගැසට් පත්‍රයෙහි මේ ආඥාව ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ සිට අවුරුදු 3 ක් විය යුතු බවද මෙයින් නිශ්චය කරමි.

ඒ. ඇෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1965 අගෝස්තු මස 19 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

8-902

---

## සමගි මණ්ඩල පනත

### නිවේදනයයි

කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගහපත්තු ගම්ප්‍රදේශය සඳහා සමගි දායකයින්ගේ සභාවක් පිහිටුවමින්, අංක 14,407 හා 65.5.28 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාව, අධිකරණ ඇමති තැන්පත් ඇලෙක්සැන්ඩර් ෆේයාර්ලි විජේමාන්න වන මම මෙයින් අවලංගු කරමි.

ඒ. ඇෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1965 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

8-904

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1963 අංක 12 දරණ පනතින් සංශෝධිත, 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වන වගන්තියෙහි (1) හා (8) වන උප වගන්තිවලින් හා 4වන වගන්තියෙහි (1) වන උපවගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර අධිකරණ ඇමති ඇලෙක්සැන්ඩර් ෆේයාර්ලි විජේමාන්න වන මම—

(අ) 1963.11.29 දින සහ අංක 13,837 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 8 න් විස්තර කරනු ලැබූ හන්වැල්ල පේරුව ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයින් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) හංවැල්ලේ, ඉහළ හංවැල්ලේ, පූජ්‍ය කැකනදුරේ ධම්සිරි ස්වාමින්වහන්සේ.
(2) මීගොඩ, ආටිගල පාරේ පදිංචි ගාර්දිය තන්ත්‍රිගේ චාර්ල්ස් රුබේරු මහතා.
(3) රණාලේ, ජල්තර පදිංචි කුරුප්පු ආරච්චිගේ දොන් රොබට් අප්පුහාමි මහතා.
(4) හංවැල්ලේ, ඉහළ හංවැල්ලේ පදිංචි සෙනරත් මුදලිගේ දොන් සිරියස් මහතා.
(5) හංවැල්ලේ, පහළ හංවැල්ලේ පදිංචි ස්ටැන්ලි වීරසිංහ මහතා.
(6) හංවැල්ලේ, පහළ හංවැල්ලේ පදිංචි අල්ලිස් ජයසිංහ මහතා.
(7) හංවැල්ලේ, ඉහළ හංවැල්ලේ පදිංචි කුළපණ බඩල්ගේ ප්‍රේමදාස මහතා.
(8) රණාලේ, ජල්තර පදිංචි දයාසිරි ඔවාසේකර රූපසිංහ ජයවර්ධන මහතා.
(9) මීගොඩ, ආටිගල පාරේ පදිංචි දොන් ඩේවිඩ් ගිරිපිටිය මහතා.
(10) හංවැල්ලේ, ආටිගල පදිංචි සමරතුංග ලියනගේ ගුණවර්ධන මහතා.
(11) මීගොඩ, ඕවිටිගම පදිංචි හෙට්ටිආරච්චිගේ බෙනඩික් එඩ්වඩ් ලෝගුස් ධම්රත්න මහතා.
(12) පාදුක්කේ, මාවතගම පදිංචි වැලිකන්නගේ දොන් ආරොන් සිංඤෝ මහතා.
(13) පාදුක්කේ, මාවතගම පදිංචි පිටියගේ රෙජිනෝල්ඩ් මහතා.
(14) බටවල, "සිංහගිරි" හි, පදිංචි දොන් කිරිනේරිස් සුදසිංහ මහතා.
(15) හංවැල්ලේ, ඉහළ හංවැල්ලේ පදිංචි බෝපෙගමගේ සාදිරිස් ජයතිස්ස මහතා.
(16) හංවැල්ලේ, ආටිගල පදිංචි ධනපාල වැලිකල මහතා.
(17) හංවැල්ලේ, ආටිගල පදිංචි දොන් පෝල් කාරියවසම් අතුකෝරාල මහතා.
(18) පාදුක්කේ, මාවතගම පදිංචි සෙන්දනායක ආරච්චිගේ සේනාරත්න මහතා.
(19) පාදුක්කේ, මාවතගම පදිංචි කඳන්හේනගේ දොන් ඔබියස් මහතා.
(20) රණාලේ, ජල්තර පදිංචි දොන් සේදිරිස් පෙරේරා අත්තනායක මහතා.
(21) හංවැල්ලේ, ඉහළ හංවැල්ලේ පදිංචි දොන් වියෝලිස් කස්තුරිආරච්චි මහතා.
(22) රණාලේ, ජල්තර පදිංචි පියදාස පෙරේරා අත්තනායක මහතා.
(23) හංවැල්ලේ, ආටිගල පදිංචි රන්ජිත් දයානන්ද පුස්වැල්ල මහතා.
(24) මීගොඩ, ඕවිටිගම පදිංචි ගෝවින්නගේ ධම්සිරි කුලරත්න මහතා.
(25) මීගොඩ, කුරුඳුවත්තේ පදිංචි උග්ගල්ලගේ දොන් සේතන් පෙරේරා මහතා.

(ආ) මීගොඩ ආටිගල පාරේ පදිංචි ගාර්දිය තන්ත්‍රිගේ චාර්ල්ස් රුබේරු මහතා එකී සභාවෙහි සභාපති වශයෙන් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත්කරනු ලැබූ කාලය ගැසට් පත්‍රයෙහි මේ ආඥාව ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ සිට අවුරුදු 3ක් වියයුතු බව ද මෙයින් නිශ්චය කරමි.

ඒ. එෆ්. විජේමාන්න,
අධිකරණ ඇමති.

1965 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-992

## 1961 අංක 13 දරණ වගාරක්ෂණ පනත

### 11 (1) වැනි උප වගන්තිය යටතේ ආඥාවයි

1961 අංක 13 දරනු වගාරක්ෂණ පනතේ 11 (1) වගන්තිය යටතේ කෘෂිකර්ම හා ආහාර කටයුතු පිළිබඳ ඇමති වරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

1965.8.18,
කොළඹ දී ය.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

ආඥාව

1961 අංක 13 දරන වගාරක්ෂණ පනතේ 11 (1) වගන්තියෙහි කාර්යයන් සඳහා මෙහි පහත දක්වන හේතූන් නියමිත හේතූන් විය යුතුය :—

1. අවශ්‍ය ප්‍රමාණ ජලය නොලැබීම
2. නියගය
3. වුවමනාවට වඩා ජලය වැඩිවීම
4. ජලගැල්ම
5. ගොයම් රෝග
6. කෘමි වසංගත
7. වල් ඌරන්
8. වල් අලි
9. කොමසාරිස්වරයා විසින් සම්මත කරන ලද ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීම.

8–884/1

## 1961 අංක 13 දරණ වගාරක්ෂණ පනත

### 12 (1) වෙනි වගන්තිය යටතේ කරන ආඥාවයි

1961 අංක 13 දරන වගාරක්ෂණ පනතේ 12 (1) වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෘෂිකර්ම හා ආහාර කටයුතු පිළිබඳ ඇමති මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1965–66 මහ කන්නය ආරම්භ වන දිනයේ පටන් ගණන් බලනු ලබන එක් අවුරුදු කාල සීමාව භයවෙනි රක්ෂණ වාරය විය යුතු බව මෙම ආඥාවෙන් නියම කරමි.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ආහාර කටයුතු පිළිබඳ ඇමති.

1965.8.18,
කොළඹ දී ය.

8–884/2

## 1961 අංක 13 දරණ වගාරක්ෂණ පනත

### 21 (1) වෙනි වගන්තිය යටතේ නිවේදනය

1961 අංක 13 දරන වගාරක්ෂණ පනතේ 24 (1) වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම හා ආහාර කටයුතු පිළිබඳ ඇමති මොහොට්ටාලගේ ඩිංගිරි බණ්ඩා වන මම 1965–66 මහ කන්නයේ සහ 1966 යල කන්නයේ වී ගොවිතැනට වන්දි ගෙවීමේදී ගෙවිය යුතු ප්‍රමාණයන් මෙහි පහත දැක්වෙන උපලේඛනයේ අන්දමට විය යුතු බැව් මෙයින් නියම කරමි.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ආහාර ඇමති.

*1965.8.18,*
කොළඹ දී ය.

උපලේඛනය

| ගොවිතැනේ අවස්ථාව | සම්පූර්ණයෙන් අලාභ වූ විට | අලාභය කොටස් වශයෙන් සිදුවූ විට | |
|---|---|---|---|
| | ප්‍රමාණය | අලාභය සියයට ගණනින් | ප්‍රමාණය |
| නැවත වරක් වැපිරීමට හෝ පැළ සිටුවීමට නුපුළුවන් කාලයේ සිට පූදින කාලය දක්වා ඇති කාල සීමාව තුළ අලාභය සිදුවූ විට | ගෙවිය හැකි වැඩිම වන්දි ප්‍රමාණයෙන් සියයට 70 | 30 සහ 30 අඩු ... | නැත |
| | | 30 ට වැඩි ... | මෙම අවස්ථාවේදී සම්පූර්ණ අලාභයක් සිදුවූ විට ගෙවන වන්දි ප්‍රමාණය හා සමානම සියයට ගණන අලාභයේ සියයට ගණන විය යුතුය |
| පූදින කාලයේ සිට ගොයම් කපා බේරන දිනය දක්වා ඇති කාල සීමාව තුළ අලාභය සිදුවූ විට | ගෙවිය හැකි වැඩිම වන්දි ප්‍රමාණයෙන් සියයට 100 | 30 සහ 30 අඩු ... | නැත |
| | | 30 ට වැඩි ... | අලාභයේ සියයට ගණන ගෙවිය යුතු වැඩිම වන්දි ප්‍රමාණයේ සියයට ගණන හා සමානම විය යුතුය. |

*8–884/3*

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ ඩබ්ලිව්. බී. දොරකුඹුර මහතා වෙනුවට එම පඩිපාලක සභාවේ නම නියමකොට පත් කෙරෙන සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිතුමන් විසින් එම්. එස්. එම්. බාවා මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. ඕ. වීරසිංහ,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1965 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

8-956

ඇල්.ඩී.—බී. 80/44.

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වන වගන්තිය යටතේ මත්පැන් හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මීට යටකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ තීරණයන් කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව ඒ ආඥාපනතේ 29 (3) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ තීරණ 1965 සැප්තැම්බර් මස 1 වැනි දින වලංගු විය යුතුය.

ඒ. ඕ. වීරසිංහ,
කම්කරු, රැකීරක්ෂා සහ නිවාස අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ දීය.

උපලේඛනය

වාර්ෂික නිවාඩු දවස් සම්බන්ධයෙන් රා, අරක්කු හා විනාකිරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1947 පෙබරවාරි මස 21 වැනි දින අංක 9,671 දරන ගැසට් පත්‍රයේ පළවූ

නිවේදනයේ උපලේඛනයෙහි දක්වා ඇත්තාවූ තීරණ, එකී උපලේඛනය අගට පහත දැක්වෙන අභිනව තීරණ එකතු කරනු ලැබී මෙන් වෙනස් කළ යුතුය :—

**ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)**

9. (අ) මේ ඡේදයෙහි හා 10 වැනි ඡේදයෙහි විධිවිධානවලට යටත්ව සෑම සේවා යෝජකයෙකුම තමා විසින් සේවයේ යොදවා ගනු ලැබ සිටින සියලුම කම්කරුවන්ට (177 වැනි අධිකාරය වන) නිවාඩු ආඥාපනතෙහි අර්ථානුකූල වූ පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත නිවාඩු දිනයක් වශයෙන් දිය යුතුය :—

(1) දෙමළ තෛපොන්ගල් දිනය.

(2) නිදහස් අනුස්මරණ දිනය (පෙබරවාරි 4),

(3) සිංහල සහ හින්දු අළුත් අවුරුදු දිනය,

(4) මැයි දිනය (මැයි 1),

(5) සිංහල මාස ක්‍රමයෙන් වෙසක් මස පුරපසළොස්වක් පොහෝ දිනය,

(6) ශුද්ධ වූ මුහම්මත් අනාගත වක්තෘන් වහන්සේගේ උපන් දිනය (උන්වහන්සේට සමාදානය වේවා, මිලාඩ්-උන්-නබි), සහ

(7) නත්තල් දිනය.

(ආ) මේ ඡේදයෙහි (අ) අනුච්ඡේදයෙහි විධිවිධාන, ඒ අනුච්ඡේදයෙහි සඳහන් යම් ආණ්ඩුවේ නිවාඩු දවසක් කම්කරුවකු වැඩ වර්ජනයක යෙදී සිටින යම් කාල සීමාවකට යෙදෙන අවස්ථාවක දී ඒ කම්කරුවාට අදාළ නොවිය යුතුය.

(ඇ) ඉහත දැක්වුණු (අ) අනුච්ඡේදයෙහි සඳහන් එක් එක් ආණ්ඩුවේ නිවාඩු දිනය වෙනුවෙන් කම්කරුවකුට ගෙවිය යුතු පඩිය—

(i) කාල මිම්මේ වැඩ සඳහා වූ අඩුම දෛනික වැටුප් ප්‍රමාණයක් අනුව ගෙවනු ලැබීමට හිමිකම් ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වූ කල්හි සාමාන්‍ය දවසකට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයට අඩු නොවිය යුතුය.

(ii) කාල මිම්මේ වැඩ සඳහා වූ අඩුම මාසික වැටුප් ප්‍රමාණයක් අනුව ගෙවනු ලැබීමට හිමිකම් ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වූ කල්හි සාමාන්‍ය දවසකට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයට අඩු නොවිය යුතුය (මෙය අඩුම මාසික වැටුප් ප්‍රමාණය 25න් බෙදා සොයාගත යුතුය) ;

(iii) කෑලි මිම්මේ වැඩ සඳහා වූ අඩුම වැටුප් ප්‍රමාණයක් අනුව ගෙවනු ලැබීමට හිමිකම් ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වූ කල්හි මේ ඡේදයෙහි (අ) අනුච්ඡේදයෙහි සඳහන් එක් එක් නිවාඩු දිනයට පෙරාතුවම වූ දින 180වේ කාලය ඇතුළත ඒ කම්කරුවා නියම වශයෙන් වැඩ කළ දිනයන් සඳහා ඔහු විසින් උපයන ලද මුළු වේතන මුදල (පාරිතෝෂික දීමනා හැර) එම දින ගණනින් බෙදා ලබා ගත යුතු ඔහුගේ සාමාන්‍ය දෛනික වේතනයට අඩු නො විය යුතුය.

10. එසේ වුව ද 9 වන ඡේදයේ (අ) අනුච්ඡේදයෙහි සඳහන් යම් ආණ්ඩුවේ නිවාඩු දිනයකදී යම් කම්කරුවකු සේවා යෝජකයකු විසින් පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව සිය සේවයෙහි යොදවා ගත හැකිය—

(i) කාල මිම්මේ වැඩ සඳහා වූ අඩුම වැටුප් ප්‍රමාණයන් අනුව ගෙවනු ලැබීමට හිමිකම් ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වූ කල්හි :—

(අ) ඒ කම්කරුවාට ආණ්ඩුවේ නිවාඩු දිනයෙන් පසුව එන දෙසැම්බර් මස තිස් එක්වන දින හෝ එදිනට පෙර දිනයක්, සාමාන්‍ය දවසකට ගෙවිය යුතු අඩුම දෛනික වේතන ප්‍රමාණයට (මාසික වැටුප් ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වූ කල්හි අඩුම මාසික වැටුප් ප්‍රමාණය 25න් බෙදා සොයා ගත යුතු) නො අඩු ප්‍රමාණයක් අනුව වූ පඩි සහිත නිවාඩු දිනයක් හැටියට දිය යුතුය, හෝ

(ආ) ඒ කම්කරුවාට, එබඳු යම් ආණ්ඩුවේ නිවාඩු දිනයක දී වැඩ කරන සාමාන්‍ය දිනයකට අයත් පැය ගණන තුළ කරන ලද වැඩ සඳහා අඩුම දෛනික වේතන ප්‍රමාණය මෙන් දෙගුණයකට නො අඩු ප්‍රමාණයක පඩියක්ද වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැය ගණනට වැඩියෙන් වැඩ කරන ලද සෑම පැයක් සඳහා (අඩුම දෛනික ප්‍රමාණය 8න් හෝ අඩුම මාසික ප්‍රමාණය 200න් බෙදා සොයා ගතයුතු) සාමාන්‍යයෙන් පැයකට ගැනෙන ප්‍රමාණය මෙන් තුන් ගුණයකට නොඅඩු ප්‍රමාණයක පඩියක් (සහ පැයකින් කොටසක් වැඩ කළ විට ප්‍රමාණානුකූලව) ද ගෙවිය යුතුය.

(ii) කෑලි මිම්මේ වැඩ සඳහා වූ අඩුම වැටුප් ප්‍රමාණයක් අනුව ගෙවනු ලැබීමට හිමිකම් ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වූ කල්හි—

(අ) ඒ කම්කරුවාට, එබඳු යම් ආණ්ඩුවේ නිවාඩු දිනයකදී කරන ලද වැඩ සඳහා කෑලි මිම්මේ වැඩ වෙනුවෙන් ඔහුට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයට නො අඩු ප්‍රමාණයක පඩියක් ගෙවිය යුතුය ; එසේම

(ආ) ඒ කම්කරුවාට, ඒ ආණ්ඩුවේ නිවාඩු දිනයෙන් පසුව එන දෙසැම්බර් මස තිස්එක්වන දින හෝ ඒ දිනට පෙර දිනයක් පඩි සහිත නිවාඩු දිනයක් හැටියට දිය යුතුය, ඒ පඩිය, ඒ විකල්ප නිවාඩු දිනය දෙන දිනයට පෙරාතුවම වූ දින 180වේ කාලය ඇතුළත ඒ කම්කරුවා නියම වශයෙන් වැඩ කළ දිනයන් සඳහා ඔහු විසින් උපයන ලද මුළු වේතන මුදල (පාරිතෝෂික දීමනා හැර) එම දින ගණනින් බෙදා ලබා ගත යුතු සාමාන්‍ය දෛනික වේතනයට අඩු නො විය යුතුය."

8-1029

---

## බන්ධනාගාර ආඥාපනත

(54 වැනි අධිකාරය) වන බන්ධනාගාර ආඥාපනතේ 35(1) වැනි වගන්තියේ ප්‍රකාර මෙහි උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් තැනැත්තා මෙම දැන්වීමේ සඳහන් දින සිට තුන් අවුරුද්දකට උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ආයතනයේ ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ගරු අධිකරණ ඇමතිතුමා විසින් පත්කොට තිබේ.

ඞී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹදී ය.

**උපලේඛනය**

| I | II |
|---|---|
| මාතර බන්ධනාගාරය | වී. ඊ. ද සේරම් මුදලිතුමා |

8-912

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

**49 ඡේදය යටතේ සහතිකය**

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965. 8. 12 දින.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ඒකල ග්‍රාම සේවක වසමේ පිහිටි ස්ට්‍රැන්ටන් වික් වත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 20 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ඞී. ඇර්. සී. පාර ; නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : එම ඉඩමේම ඉඩහැර ඇති පුද්ගලික පාර ; බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

8-849

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

**49 ඡේදය යටතේ සහතිකය**

කම්කරු, රැකී රක්ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි

2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

1965.8.12 දින,
කොළඹ දීය.

## උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කඳාන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අංක 175 දරණ තෙලගපාත ග්‍රාමසේවක වසමේ පිහිටි කොළඹ මීගමුව පාරේ (වත්තල) වරිපනම් අංක 15 දරණ ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 12 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ඒ. ඇම්. ස්ත්‍රාව්ඩර් මහතාට අයත් ඉඩම ; නැගෙනහිරට : කොළඹ, මීගමුව පාර ; දකුණට : ජෝන් පෙරේරාට අයිති ඉඩම ; බස්නාහිරට : කැළණි ගඟ.

8-848

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති මොහමඩ් හනීෆා මොහමඩ් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ඇම්. එච්. මොහමඩ්,
කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති.

2.8.65 දින,
කොළඹ දීය.

## උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මොරටුමුල්ල ග්‍රාම සේවක වසමේ පිහිටි මාතරයවත්ත හෙවත් මුදියන්සේලාගෙවත්ත තල්කොටයාවත්ත සහ තන්තුලාගෙවත්ත නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එෆ්. ගෝමස් මහතා විසින් 1960.2.13 වැනි දින සකස් කළ අංක 195 දරණ මානක සැලැස්මේ සඳහන් ලොට් අංක 2 දරණ පහත සඳහන් පරිදි මායිම් ඇති පර්. 24.06 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : ලොට් අංක 1 සහ ලොට් අංක 3 දරණ වෙන් කරන ලද පාර ; නැගෙනහිරට : ලොට් අංක 4 ; දකුණට : ජේ. ඒ. ඩබ්ලිව්. රුද්‍රිගු සතු දේපොල ; බටහිරට : ජේ. සී. ද සිල්වා සතු දේපොල.

8-847

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රජයේ දැන්වීමයි

### කොළරා—මොර්මුගෝ වරාය සහ ලක්නව් ගුවන් තොටුපළ

ඉහත සඳහන් ප්‍රදේශ කොළරා රෝගය පැතිර ඇති ප්‍රදේශයන් බවට ප්‍රකාශ කර තිබෙන බව මෙයින් සියලු දෙනාගේම දැන ගැනීම පිණිස ප්‍රකාශ කරමි. එ බැවින් ඉහත සඳහන් ප්‍රදේශවලින් පැමිණෙන මගීන්ගෙන් කොළරා රෝගයට අත් එන්නත් කිරීමේ සහතිකයට අමතරව ලංකාවේ කිසියම් වරායක ගොඩබාන අළුත් මාළු, කටුවෙන් ආවරණ වූ මාළු (ෂෙල්ෆිෂ්) එළවළු, පළතුරු, හකුරු, මස්කට් (එසේත් නැතහොත් කොළරා රෝගය පැතිර යාමට අදාලවන වෙනත් ආහාර ද්‍රව්‍යයන්) ලංකාවට ගෙන ඒම තහනම් කර ඇත.

ඉහත සඳහන් ප්‍රදේශ කොළරා රෝගයෙන් තොරවූ වහාම තවත් දැන්වීමක් පළ කරනු ලැබේ.

අධ්‍යක්ෂ,
නිරෝධායන දෙපාර්තමේන්තුව.

නිරෝධායන කාර්යාලය,
කොළඹ, 21. 8. 65.

8-957

---

මගේ අංකය : ග්‍රා. 3/8.

## වන්දනා කරුවන්ගේ ආඥපනත

### පාන්දිරුප්පු තුරපති අම්මන් කෝවිල් උත්සවය—1965

ඉහත සඳහන් උත්සවය 65.9.21 වැනි දින ආරම්භ කොට 65.10.8 වැනි දින අවසන් වෙන බව එයට සහභාගි වන වන්දනා කරුවන් සහ අදාල සියලු දෙනා වෙත මෙයින් දැණුම් දෙනු ලැබේ. මෙම උත්සවය පැවැත්වෙන සමය තුල බලපාන, 1951.5.11 වැනි දින අංක 10,247 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ස්ථාවර නීති වලට මෙයට සහභාගි වන වන්දනා කරුවන්ගේ සහ අදාල සියලු දෙනාගේ අවධානය යොමු කෙරේ.

51.5.11 වැනි දින අංක 10,247 දරන ගැසට් පත්‍රයෙහි සඳහන් කඳවුරු පෙදෙස පහත සඳහන් අයුරින් විශාල කොට ඇත :—

උතුරින් : කතන්ත පාරින්ද ;
නැගෙනහිරින් : පාන්දිරිප්පු ධීවර පාරින්ද ;
දකුණින් : අරසදි අම්මන් කෝවිල් පාරින්ද ;
බටහිරින් : මඩකලපු-කල්මුනේ ර. වා. දෙ. පාරින්ද මායිම්වේ.

ඉසැඩ්. එස්. රපායල්,
අම්පාර දිසාපති වෙනුවට.

65. 8. 20 වැනි දින,
උහන කච්චේරියේ දී.

8-974

---

මගේ අංකය : ග්‍රා. 3/9.

## වන්දනා කරුවන්ගේ ආඥපනත

### කල්මුනේකුඩි කබල් කරෙයි පල්ලි උත්සවය

ඉහත සඳහන් පල්ලි උත්සවය 65. 9. 21 වැනි දින පටන් ගෙන 65. 10. 7 වැනි දින අවසන් වෙන බව එයට සහභාගි වන වන්දනා කරුවන් සහ අදාල සියලු දෙනාම වෙත මෙයින් දන්වනු ලැබේ.

ඉහත සඳහන් උත්සවය පැවැත්වෙන සමය තුල බලපාන 63.2.22 වැනි දින අංක 13,529 දරන රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද ස්ථාවර නීති වලට මෙයට සහභාගි වන වන්දනාකරුවන්ගේ සහ අදාල සියලු දෙනාගේ අවධානය යොමු කරවමි.

ඉසැඩ්. එස්. රපායල්,
අම්පාර දිසාපති වෙනුවට.

65.8.20 වැනි දින,
උහන කච්චේරියේ දී.

8-975

---

## දැන්වීමයි

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේව මැදි හත්පත්තු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ගවයින් අතර, "රක්තාශ්‍රව නැමති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝ වෙන රෝග සම්බන්ධ (සංශෝධිත) පනත සහ (සතුන්ගේ) බෝවෙන රෝග පිළිබඳ ආඥපනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය (470 වැනි පරිච්ඡේදය) යටතේ මා විසින් වර්ෂ 1965.6.11 දින අංක 14,421 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී.

1965.8.16 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේ දී.

8-882

---

## ගමනාගමනයට බාධා පැමිණවීම

### බටහිර කොට්ඨාශය—උතුරු කොළඹ දිස්ත්‍රික්කය

### වික්ටෝරියා පාළම—කොළඹ-පුත්තලම පාර

ඉහත සඳහන් පාළමේ මාර්ග තලය අළුත්වැඩියා කිරීම සඳහා 1965 අගෝස්තු මස 31 වෙනි දින සිට 1965 සැප්තැම්බර් මස 4 වෙනි දින දක්වා සියලු රථවාහන ධාවනයට වසා තබනු ලැබේ.

විකල්ප මාර්ගය—අලුත් කැළණි පාළම ඔස්සේ මාර්ගයයි.

ඇන්. ජී. වික්‍රමසිංහ,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ 1,
1965 අගෝස්තු මස 23 දින දීය.
8-1032

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනය

**ආඥාපනතේ (402 අධිකාරය) 64 වෙනි වගන්තිය යටතේ නිවේදනයයි**

1. කොළඹ, යෝක් වීදියේ, ජේම්ස් ෆොබනාගිල්ලේ, සීමාසහිත පිරිස් සහ අබේවර්ධන මහතුන්.

2. නාවලපිටියේ නගර සභාවේ සභාපති.

1963.8.29 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව තීරණය කරගත් බව මෙයින් දනුම් දෙමි:—

මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටියේ බලන්තොට වතුයායේ පදිංචි ඕමාර් ලෙබ්බේ මොහමඩ් ලෙබ්බේ මහතා විසින් කොළඹ ජනනොතාරිස් වන ඇස්. ඊ. අබේසූරිය මහතා විසින් 1956 ජනවාරි 16 වෙනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනය නමට ලියා සහතික කරණ ලද අංක 181 දරණ උකස්කරයේ ප්‍රකාර මුදල් ගෙවීම පැහැරහැර ඇති හෙයින්ද දනට එකී උකස්කරයේ ප්‍රකාර රුපියල් දෙලක්ෂ දහහතරදහස් හයසිය හතලිහක් සහ ශත දහසයක් (රු. 2,14,640.16ක්) ආයතනයට ගෙවිය යුතුව ඇති හෙයින්ද ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ ආඥාපනත (1956 සංශෝධිත නීති ප්‍රඥාප්ති සංග්‍රහයේ 402 අධිකාරය) යටතේ ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ඇස්. ඊ. අබේසූරිය ජන නොතාරිස් විසින් 1956 ජනවාරි 16 වෙනි දින ලියා සහතික කරණ ලද අංක 181 දරණ උකස්කරයේ ප්‍රකාර උකස්කළ දේපළ මහනුවර බලයලත් වෙන්දේසිකරු වන ලොයිඩ් සමරවික්‍රම මහතා විසින් එකී මුදලවූ රු. 2,14,640.16 ක් ද 1963. 8. 30 දින සිට වර්ෂයකට සියයට 5 බැගින් විකුණනු ලබන දින දක්වා රු. 1,94,998.76ක් වන මුලු මුදලට පොළියද වෙන්දේසි ගාස්තුද අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සම්මත කරගන්නා ලදී.

හි. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

292, ගාලු පාර,
කොළඹ 3,
1965.8.4 දිනදීය.

8-858

---

## ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණය දෙන ආයතනය

**ආඥාපනතේ (402 අධිකාරය) 71 වෙනි වගන්තිය යටතේ කරගත් සම්මතයයි**

1965.2.18 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කරගත් බව මෙයින් දනුම් දෙමි:—

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන, උදන්විට පදිංචි රාමනාද මුදියන්සේලාගේ චන්ද්‍රසේකර නොහොත් රොබට් මිත්‍රදකුලසූරිය චන්ද්‍රසේකර සහ වර්ණකුලසූරිය මුදියන්සේලාගේ පියසේන චන්ද්‍රසේකර (සැමියා සහ බිරිඳ) විසින් බී. එච්. ආර්. ටී. සෙනෙවිරත්න ජන නොතාරිස් විසින් 1956. 2. 17 වෙනි දින ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනය නමට ලියා සහතික කරණ ලද අංක 189 දරණ උකස්කරයේ ප්‍රකාර මුදල් ගෙවීම පැහැරහැර ඇති හෙයින්ද දනට එකී උකස්කරයේ ප්‍රකාර රුපියල් හාරදාස් දෙසිය අනූ අටක් සහ ශත දහහතරක් (රු. 4,298.14 ක්) ආයතනයට ගෙවිය යුතුව ඇති හෙයින්ද ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ ආඥාපනත (1956 සංශෝධිත නීති ප්‍රඥාප්ති සංග්‍රහයේ 402 අධිකාරය) යටතේ ලංකාවේ කෘෂිකර්ම සහ කර්මාන්ත ණයදෙන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව එකී බී. එච්. ආර්. ටී. සෙනෙවිරත්න ජන නොතාරිස් විසින් 1956.2.17 වෙනි දින ලියා සහතික කරණලද අංක 189 දරණ උකස්කරයේ ප්‍රකාර උකස්කළ දේපළ කෑගල්ලේ බලයලත් වෙන්දේසිකරු වන ටී. ජයවර්ධන විසින් එකී මුදලවූ රු. 4,298.14ක් ද 1965. 2. 18 දින සිට වර්ෂයකට සියයට 6 බැගින් විකුණනු ලබන දින දක්වා රු. 3,932.08 වන මුලු මුදලට පොළියද වෙන්දේසි ගාස්තුද අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සම්මත කරගන්නා ලදී.

හි. සැ. පො. ගුණවර්ධන,
සාමාන්‍යාධිකාරී.

292, ගාලු පාර,
කොළඹ 3,
1965.8.17 දින දීය.

8-859

---

## දැන්වීමයි

1965 ජූලි මස 30 වෙනි දින නිකුත් කරන ලද අංක 14,464 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) ඡේදයේ මවිසින් පළ කරන ලද 1965.7.23 වෙනි දින දරණ දැන්වීම, "1958 අංක 29 දරණ සතුන් පිළිබඳ පනත යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1962 නොවැම්බර් මස 29 වෙනි දින නිකුත් කරන ලද අංක 13,406 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ" යනුවෙන් මෙයින් සංශෝධනය කරමි.

ලීල් ගුණසේකර,
කෑගල්ල දිස්ත්‍රික්කයේ දිසාපති.

1965 අගෝස්තු මස 20 වෙනි දින,
කෑගල්ල කච්චේරියේදී ය.

8-913

---

## දැන්වීමයි

**මාර/විද්‍යාතිලක පිරිවෙන, දීඝවාලුකාරාම මහා විහාරය, දික්වැල්ල**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ලේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ අධාර ලබන පිරිවෙනක් ලෙස 1964.2.18 වෙනි දින සිට තාවකාලික වශයෙන් ලියා පදිංචි කළ බව මෙයින් දන්වමි.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

ජී. ඇස්. පී. ඒ. 100,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය,
කොළඹ, 1965.8.18 දින දී ය.

8-880

---

## වන්දනා ගමන් ආඥාපනත

**වෙල්ලස්ස, බිබිලේ කොටබෝව කුඩා කතරගම දේවාලයේ 1965 ඇසළ උත්සවය**

යථෝක්ත උත්සවය 1965 අගෝස්තු මස 27 වැනි දින ආරම්භ වී 1965 සැප්තැම්බර් මස 11 වැනි දින දක්වා පැවැත්වෙන බව මහජන දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

1964.7.24 වැනි දින අංක 14,117 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පතේ සඳහන් නිත්‍ය නියෝග කෙරෙහි විශෙෂ අවධානය යොමුකරමි.

ඇම්. ටී. ඩබ්ලිව්. අමරසේකර,
මොනරාගල දිස්ත්‍රික්කයේ වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත

1965 අගෝස්තු මස 17 වැනි දින,
මොනරාගල කච්චේරියේදීය.

8-877

---

## වන්දනා ගමන් ආඥා පණත

**කොක්කොඩිචෝලෙයි තාන්තෝන්තිරිස්පරන් කෝවිල් උත්සවය—1965**

යථෝක්ත උත්සවය 1965 අගෝස්තු මස 28 දින පටන්ගෙන 1965 සැප්තැම්බර් 14 දින දක්වා පවත්වනු ලබන බව එකී උත්සවය සඳහා පැමිණෙන අයගේ සහ අනිකුත් සියලුදෙනාගේම දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1952 අගෝස්තු මස 15 වෙනි දින අංක 10,434 දරණ ලංකාණ්ඩුවේ ගැසට් නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේදී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේත් අනිකුත් අයගේත් අවධානය මෙයින් යොමු කරවමි.

ආර්. ජේ. ජේ. ඕ. ගුණසේකර,
මඩකලපු දිසාවේ වැඩබලන දිසාපති.

ඊසී/ඩී—39(1).
1965 ක්වූ අගෝස්තු මස 18 දින,
මඩකලපුවේ දිසාපති කාර්යාලයේ දිය.

8-836

## රථවාහන ගමනාගමනයට බාධා

### දකුණු පළාත—මාතර දිස්ත්‍රික්කය

### තිබ්බොටුවාව-දංකොළුව පාරේ අංක 8/2 දරන පාලම නැවත තැනීම

පූර්වෝක්ත පාලම නැවත සෑදීම සඳහා ඉහතකී මාර්ගය සියලුම රථවාහන ගමනාගමනය කළ නොහැකි සේ 1965.8.1 වැනි දින සිට 1965.8.31 වැනි දින දක්වා වසා තබන බව මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

2. විකල්ප මාර්ගය වශයෙන් අකුරැස්ස-දෙනියාය හරහා මාර්ගය පාවිච්චි කළ හැක.

ආර්. ජී. වික්‍රමසිංහ,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 1965.8.19.

8-916

---

## ප්‍රකාශනයයි

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ආදායම්පාලක නිලධාරි කොට්ඨාශයේ ගම්මල ගවයින් අතර "රක්තාශ්‍රව" නමැති රෝගය පැතිර යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) පනත යටතේ මට පැවරී තිබෙන බල තල අනුව සහ (සතුන්ගේ) බෝවෙන රෝග පිළිබඳ ආඥාපනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය (470 වැනි පරිච්ඡේදය) අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට: තල්පිටි ඇල සහ බොල්ගොඩ කලපුව; දකුණට: කලපුගම, දෙල් දූව, පොහොද්දරමුල්ල සහ පොතුපිටිය; නැගෙනහිරට: තැප්පු ඇල; බස්නාහිරට: මුහුද.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශය ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කළුතර පශු වෛද්‍ය තැනගේ හෝ පානදුර කරවන ප්‍රාදේශීය ආදායම්පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1965. 8. 21 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි
කාර්යාලයේ දී.

8-930

## ප්‍රකාශනයයි

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ තුනුකායි ආදායම්පාලක නිලධාරි කොට්ඨාශයේ කෝරළේ තුනුකායි ග්‍රාම සේවක කොට්ඨාශයේ අලන්කුලම් ගමේ ගවයින් අතර "රක්තාශ්‍රව" නමැති රෝගය පැතිර යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) පනත යටතේ මට පැවරී තිබෙන බල තල අනුව සහ (සතුන්ගේ) බෝවෙන රෝග පිළිබඳ ආඥාපනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය (470 වැනි පරිච්ඡේදය) අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට: අළුත් කරච්චි ආදායම් පාලක නිලධාරීගේ කොට්ඨාශයේ දකුණු සහ බටහිර මායිම්; දකුණට: මන්නාරම දිස්ත්‍රික් මායිම; නැගෙනහිරට: වව්නියා සහ මන්නාරම් දිස්ත්‍රික් මායිම්; බස්නාහිරට: මන්නාරම් දිස්ත්‍රික්කයේ මායිම.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශය ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්තකරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කිලිනොච්චි පශු වෛද්‍ය තැනගේ හෝ තුනුකායි කරවන ප්‍රාදේශීය ආදායම්පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1965. 8. 21 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි
කාර්යාලයේ දී.

8-929

---

## වතු පාරවල් ප්‍රසිද්ධ පාරවල් බවට පරිවර්තනය කිරීමේ ආඥාපනත (ව්‍යවස්ථා අණපනත්—196 වන පරිච්ඡේදය)

වතු පාරවල් ප්‍රසිද්ධ පාරවල් බවට පරිවර්තනය කිරීමේ ආඥාපනතේ (196 වන පරිච්ඡේදය) දෙවැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති, හපුතන්තිරිගේ ලීලාරත්න ගුණසේකර වන මම මෙයින් නියෝග කර,

(අ) (1) මීට යාකොට ඇති දළ සැලැස්මේ, ඒ. බී. සී. වශයෙන් ලකුණුකර, මෙහි දක්වෙන උපලේඛනයෙන් වඩාත් විස්තර කර ඇති, හැමින්පෝඩ් වතුපාර ප්‍රසිද්ධ පාරක් විය යුතු බවද,

(2) එම පාර මධ්‍යයේ සිට අඩි විසිපහක් ඇතුළත කොටස, පාර පළල් කිරීම, දික් කිරීම හෝ බෙදීම සඳහා මාර්ග රක්ෂිත බිම් තීරුවක් විය යුතු බවද,

(ආ) (අ) ඡේදයේ සඳහන් වතු පාර නඩත්තු කිරීමේ වගකීම මෙම පාරට බලපාන වත්තේ අයිතිකරු හෝ අයිතිකරුවන් වෙත පැවරෙන බවද ප්‍රකාශ කර සිටිමි.

ලීල් ගුණසේකර,
කෑගල්ල පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති.


1965.8.17 දින,
කෑගල්ලේ කච්චේරියේ දී ය.

උපලේඛනය

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පරකඩුව-බැවිල-දිගෝව පාරේ 2 වැනි සැතපුම් කණුවෙන් බෙදී ගොස් හෙමින්පෝඩ් වත්තේ කර්මාන්තශාලාව දක්වා, හැමින්පෝඩ් වත්තේ පිහිටි දිගින් සැතපුම් 3.242 ක් වූ වතුපාර.

# HEMINGFORD ESTATE ROAD

Scale:- 1 Inch to a mile




EXECUTIVE ENGINEER'S OFFICE
P.W.D. RATNAPURA
DATED. 17.10.61

E.E. Ratnapura

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට සැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති හට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය නියෝගයන් සඳහා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි